අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය 'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு 'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
Ministry of Education, Higher Education and Vocational Education 'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/9/18/15/22

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2026.01.

සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත,

**2026 අයවැය යෝජනා යටතේ අඩු ආදායම්ලාභී පවුල්වල ආබාධ සහිත සිසුන්ට ශිෂ්‍යාධාර ලබාදීමේ අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීම**

ආබාධ සහිත දරුවන් අධ්‍යාපනය සඳහා යොමු වීම පසුගාමී මට්ටමක පවතින බැවින් එම දරුවන් අධ්‍යාපන කාර්ය සඳහා යොමු කිරීමේ අරමුණින් අඩු ආදායම්ලාභී පවුල්වල ආබාධිත දරුවන් සඳහා වෛද්‍ය නිර්දේශය මත එක් දරුවෙකුට රුපියල් 5000 ක දීමනාවක් මාසිකව ලබා දීමට 2026 අයවැය මගින් යෝජනා කර ඇත. ඒ අනුව, මෙම දීමනාව ලබාදීමට අවශ්‍ය උපදෙස් පහත සඳහන් කර ඇත.

01. ඔබ වෙත මෙම උපදෙස් සංග්‍රහය සහ අදාළ අයදුම්පත්‍රය ලද විගස පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය / සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (විශේෂ අධ්‍යාපන) වෙත සහ සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත කඩිනමින් යොමු කිරීමට කටයුතු කළ යුතු වේ.

02. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු මගින් සියලු ම විදුහල්පතිවරුන්, උපකෘත පාසල්හි විදුහල්පතිවරුන් සහ සියලු ම පිරිවෙන්හි පරිවේනාධිපතිවරුන් වෙත මෙම උපදෙස් පත්‍රය හා අයදුම්පත කඩිනමින් යොමු කර සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2026.02.15 දිනට පෙර විදුහල්පති මගින් අධ්‍යාපන අමාත්‍යාංශයේ නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන ශාඛාව වෙත එවීමට කටයුතු කිරීම අවශ්‍ය වේ.

03. ශිෂ්‍යාධාර අපේක්ෂාකරන සෑම ශිෂ්‍යයෙකු / ශිෂ්‍යාවක් සඳහාම අයදුම්පත්‍රයක් සම්පූර්ණ කළ යුතු අතර "විදුහල්පති විසින් ම සම්පූර්ණ කළ යුතු යි" යන කොටස් දෙකෙහි තොරතුරුවල නිවැරදිතාවය පිළිබඳ වගකීම විදුහල්පතිට පැවරෙන්නේය.

04. මෙම ශිෂ්‍යාධාරය සඳහා ඉල්ලුම්පත් යොමු කරන සිසුන් අදාළ සුදුසුකම් (අඩු ආදායම්ලාභී එනම් පවුලේ වාර්ෂික ආදායම රු. 180,000ට අඩු සහ ආබාධ සහිත දරුවකු වීම) සපුරාලීම අත්‍යවශ්‍ය වේ. ඒ අනුව අදාළ සුදුසුකම් සපුරාලන සිසුන්ගේ අයදුම්පත් පමණක් යොමු කිරීමට විදුහල්පතිවරුන් දැනුවත් කිරීමට කටයුතු කිරීම අවශ්‍ය වේ.

05. අදාළ අයදුම්පත්‍රය විදුහල්පති විසින් අවශ්‍ය දෙමව්පියන් වෙත ලබාදිය යුතු ය. එහිදී විදුහල්පති විසින් අයදුම්පත්‍රයේ මූලික තොරතුරු සහ ශිෂ්‍ය තොරතුරු කොටස් සම්පූර්ණ කර දෙමව්පියන්ට ලබා දිය යුතු ය.

teachmore.lk

CamScanner

06. දෙමව්පියන් විසින් අයදුම්පත්‍රය තම ප්‍රදේශයට අයත් ග්‍රාම නිලධාරි වෙත ඉදිරිපත් කර අදාළ කොටස් සම්පූර්ණ කර නිර්දේශය ලබා ගෙන ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු ය. ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය සහිත අයදුම් පත්‍රය දෙම්පියන් විසින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා / රජයේ රෝහලක වෛද්‍යවරයකු වෙත ඉදිරිපත් කර අදාළ කොටස සම්පූර්ණ කර වෛද්‍ය නිර්දේශය ලබා ගත යුතු ය.

07. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය දෙමව්පියන් විසින් නැවත විදුහල්පති වෙත භාරදිය යුතු අතර විදුහල්පති එම අයදුම්පත්‍රයේ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමෙන් පසු අධ්‍යාපන අධ්‍යක්ෂ, නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල ලිපිනයට 2026.02.15 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවීමට කටයුතු කළ යුතු ය.

එම්.වී.එස්. ගුණතිලක
අධ්‍යාපන අධ්‍යක්ෂ (නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන)
ලේකම් වෙනුවට

පිටපත:-

නියෝජ්‍ය / සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (විශේෂ අධ්‍යාපන) - කරු. අ.ක.ස.

teachmore.lk



CamScanner